**<u>බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස්</u>**
**<u>තනතුරට උසස් කිරීම</u>**

බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ 2015.01.01 දින සිට 2019.12.31 දක්වා වාර්තා වී ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02 . **බඳවා ගන්නා ආකාරය**

I. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2009.04.07 දිනැතිව අනුමත කරන ලද බස්නාහිර පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාවේ 09 ඡේදයේ සඳහන් නිර්ණායක යටතේ පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

II. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයෙන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව සතුටුදායක සේවා කාලයක් සහිත ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට උසස් කිරීම , බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

III. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ SL – 1 2006 හි 20 වන වැටුප් පියවර
රු.22,935 - 10 x 645 – 8 x 790 – 17 x 1050 – 53,555/-

03. **සපුරාලිය යුතු සුදුසුකම්**

I. බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු තනතුරට අදාල සේවයේ නියුක්ත වීම.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න සේවා කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

04. බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

05. සෑම අයදුම්පත්‍රයක්ම ඔබගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **<u>2020.10.21</u>** දිනට පෙර හෝ ඊට පෙර ලැබෙන **සේ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628,10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **බස්නාහිර පළාත් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට උසස් කිරීම** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

06. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

07. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk යන නිල වෙබ් අඩවියේද පළකර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

2020 ඔක්තෝබර් මස 07

**බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස්**
**තනතුරට උසස් කිරීම**

1. නම (මුලකුරු සමග) : ......................................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් : .........................................................................................
3. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව හා එහි ලිපිනය :..........................................................

   …...............................................................................................................................

4. වර්තමාන සේවා ස්ථානය හා එහි ලිපිනය :............................................................................

   …...............................................................................................................................

5. සේවය ස්ථිර කරන ලද දිනය : ...........................................................................................
6. දුරකථන අංකය : රාජකාරි - ................................... පෞද්ගලික - ..................................................
7. ස්ත්‍රී / පුරුෂ භාවය : ......................................................................................................
8. ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................
9. බස්නහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද දිනය : ..............................................
10. බස්නාහිර පළාත් ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට පත්කරන ලද දිනය :

    ............................. පත්වීම් ලිපියේ යොමු අංකය හා දිනය : ...........................................................
11. බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරට පත්කරන ලද

    දිනය : ............................. පත්වීම් ලිපියේ යොමු අංකය හා දිනය : ...........................................................

    සේවා කාලය : .................................................
12. 12.1 බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු සේවා කාලය තුළ

    කිසියම් විනය දඬුවමක් ලබා තිබේද ? ...................................................................................

    12.2 විනය පරීක්ෂණයකය ලක්කර හෝ එසේ කිරීමට නියමිතව තිබේද ? .........................................

    12.3 එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. .............................................................................
13. බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු සේවා කාලය තුළ

    වැටුප් රහිත නිවාඩු ලබා තිබේද ? .........................................................................................

    එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ....................................................................................
14. බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු සේවා කාලය තුළ

    සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ...........................................................................

    එසේ නොවේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. .......................................................................

මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සාවද්‍ය යැයි තහවුරු වුවහොත් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට උසස් කිරීම පිළිබඳ වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

…....................................................

දිනය : …......................... නිලධාරියාගේ අත්සන

<u>**ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**</u>

1. මෙම ආයතනයේ සේවයේ නියුතු බස්නාහිර පළාත් ආදායම් සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ තක්සේකරු ........................................................................................ මහතා / මහත්මිය විසින් සපයා ඇති තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමග සසඳා බලන ලද බවත්, මෙම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මා පෞද්ගලිකවම සෑහීමකට පත්වන බවත්,
2. මෙම නිලධාරියා / නිලධාරිණිය 2019.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ විනය විරෝධි කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු සිදු කළ බවත් / නොකළ බවත් / එසේ සිදු කිරිමට අදහස් කරන බවත් / නොකරන බවත්,
3. මෙම නිලධාරියා / නිලධාරිණිය 2019.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්,
4. මෙම නිලධාරියා / නිලධාරිණියගේ 2019.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත බවත්/ නැති බවත්,

- සටහන - වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම්, වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම්, විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර ඇත්නම් හෝ විනයානුකූලව කටයුතු කිරීමට හෝ අදහස් කරන්නේනම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

5. මෙම නිලධාරියා / නිලධාරිණිය බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ I වන පන්තියේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරට උසස් කිරිම සඳහා 2009.04.07 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාව අනුව සියළුම සුදුසුකම් සපුරා ඇති / නැති බව නිර්දේශ කරමි.

.....................................................

දිනය : ............................ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**6. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත නිර්දේශය හා එකඟ වෙමි / නොවෙමි.

.....................................................

දිනය : .............................. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**7. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

ඉහත නිර්දේශය හා එකඟ වෙමි / නොවෙමි

…..................................................

දිනය : …..............................

ප්‍රධාන ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රාව